# අනුරාධපුර යුගයේ භික්ෂුණී අධ්‍යාපනය

කේ.එම්.පී.එම්. බණ්ඩාර[1], ඒ.එම්.ජී.ඩී.එස්. ප්‍රේමතිලක[2]

අනුරාධපුර යුගයේ සංවිධිත ලෙස අධ්‍යාපනය ව්‍යාප්ත වන්නේ මහින්දාගමනයේ ප්‍රතිඵලයන් ලෙසය. අනුරාධපුර යුගයේ භික්ෂුණී අධ්‍යාපනය කෙබඳුවී ද යන්න විමර්ශනය කිරීමේ දී අනුරාධපුර යුගයේ අධ්‍යාපනයේ ස්වභාවය විමර්ශණය, අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ භික්ෂුණීන්ගේ දායකත්වය අධ්‍යයනය හා සමාජීය වැදගත්කම සොයා බැලිම පර්යේෂණයේ අරමුණු වේ. ක්‍රමවේදය ලෙස ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශයේ ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදය භාවිත කරන ලදී. මහින්දාගමනයේ ප්‍රතිඵලයන් ලෙස බෞද්ධ මුහුණුවරකින් භික්ෂුණී අධ්‍යාපනය සංවිධිතව ව්‍යාප්තවී ඇත. සංඝමිත්තා තෙරණිය සමග පැමිණි සියලු දෙනාම ත්‍රිපිටකධාරිනියන් වූවා සේම පැවරුණු වැදගත්ම කාර්යය අනුරාධපුරයේ නැවතී සිට ත්‍රිපිටකය ඉගැන්වීමය. මේ අනුව හත්ථාල්හක මෙහෙණවර කේන්ද්‍රකරගෙන පෙළදහම ඉගැන්වීමක් ලෙස භික්ෂුණී අධ්‍යාපන ක්‍රමය ඇරඹිණි. මුලින් තමන්ගේ විමුක්තියත් පාරිශුද්ධියත් උදෙසා සසුනට පිවිසි භික්ෂුණීන් විසූ ආරාම පසුව අධ්‍යයන අධ්‍යාපන ආයතන බවට පත්විය. නවක මෙහෙණියෝත් පොදු බාලිකාවෝත් එහි අධ්‍යාපනය ලැබූහ. අලුවිහාර සංගායනාවට භික්ෂූන් මෙන්ම භික්ෂුණීන් ද සහභාගී වීම තුළ භික්ෂුණින් තුළ පැවතියාවූ ධර්ම ඥානය මැනවින් පසක් වේ. මෙම සංගායනාව අධ්‍යාපන ක්ෂේත්‍රය අතින් බලන කල්හී අතිශය වැදගත් සංසිද්ධියකි. ත්‍රිපිටකය හොඳින් ප්‍රගුණ කළ භික්ෂුණීන් 20000 ක් රුහුණු ප්‍රදේශයෙන් අනුරාධපුරයට පැමිණ අභය රජුගේ අනුග්‍රහයෙන් (ක්‍රි.ව.19-29) විනය උගන්වා ඇත. ඒ අනුව භික්ෂුණීන් ඉගෙනීමේ මෙන්ම ඉගැන්වීමේ ද නිරතව ඇත. මෙයින් භික්ෂුණීන්ගේ අධ්‍යාපනයේ දියුණුව හා සසුන්ගත භික්ෂුණීන්ගේ ත්‍රිපිටක අධ්‍යාපන සේවය දියුණු මට්ටමක පැවති බව පැහැදිලි වේ. දීපවංසයට අනුව මහරු හා සීවලී නම් තෙරණින්, 20000ක පිරිසක් සමග අභය රජුගේ ඇරයුමෙන් දඹදිවින් මෙරටට වැඩමවා අනුරාධපුරයේ නැවතී සිට ත්‍රිපිටකය උගන්වා ඇත. විදෙස් රටවලින් පරප්‍රාප්ත ආචාර්යවරියන් ගෙන්වා අධ්‍යාපනය ලැබීම තුළින් අනුරාධපුර අවධියේ භික්ෂුණී අධ්‍යාපනයේ පැවතියා වූ සමෘධිය පසක් වේ. අනුරාධපුර යුගයේ මුල් භාගයේ මෙරට භික්ෂුණී අධ්‍යාපනය සිදු වූයේ මහාවිහාරය මුල්කරගත් හත්ථාල්හක මෙහෙණවර මගිනි. කල්යත්ම මහාවිහාරය, අභයගිරිය, ජේතවනය, ලෙස ප්‍රධාන ගුරුකුල 03ක් හා ඊට අනුබද්ධව කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ අධ්‍යාපන ආයතන ද බිහිවිය. ඒ අනුව භික්ෂුණී අධ්‍යාපනය මෙම ගුරුකුල පදනම් කරගෙන සංවර්ධනය විය. මුල් අවධියේ පෙළදහම, කියවීම, ලිවිම, ආදිය විෂයපථය විය. අභයගිරිය කේන්ද්‍රකරගත් මහායාන ධර්මයේ ව්‍යාප්තියත් සමග විෂය ක්ෂේත්‍රය මහායාන දහම, සංස්කෘත භාෂාව, ඉතිහාසය, කාව්‍ය ශාස්ත්‍රය, වෛදය ශාස්ත්‍රය, ජ්‍යෝතිෂය, ගණිතය, තර්කශාස්ත්‍රය, දර්ශණවාදය, ආදී ලෙස ප්‍රසාරණය විය. ක්‍රි.ව. 1017 දී අනුරාධපුර රාජධානිය බිඳවැටෙන තුරු සංවිධිත වූ පෘථුල භික්ෂුණී අධ්‍යාපනයක් පැවතිබව හඳුනාගත හැකිය.

ප්‍රමුඛ පද : භික්ෂුණී අධ්‍යාපනය, ත්‍රිපිටකය, ගුරුකුල, සංගායනාව, ධර්මඥානය

[1 2] සමාජීය විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.madusankap329@gmail'com